## ඔබ සේවාවක් වෙත ගිය පසු සොයා බැලිය යුතු දේ

- ඔබව සාදරයෙන් පිළිගන්නා බවට හැඟීමක් ඇති වුණිද? ඉහළ ගුණාත්මකභාවය ඇති පහළ බාලාංශ වැඩසටහන් පදම්වන්නේ පවුල් සහ ශික්ෂණයන් අතර ඇති හවුල්කාරිත්වය මතවේ. ශික්ෂකයන් විසින් ඔබගේ දරුවා සහ ඔබගේ පවුල සම්බන්ධ ප්‍රශ්න ඇසුවේද? ඔබගේ ප්‍රශ්න සහ ගැටළු සම්බන්ධයෙන් ශික්ෂකයන් උනන්දුවක් දැක්වූයේද?
- ඔබගේ දරුවා ඔබ සමඟ සිටියේ නම්, ශික්ෂකයන් ඔබගේ දරුවා සමඟ කෙළින්ම සම්බන්ධවූයේද (ඔබගේ දරුවා සමඟ ඔබ හරහා කථාකරනවා වෙනුවට)?
- සේවාව භාවිතා කරන දරුවන්ගේ සංස්කෘතීන් සමරණ විවිධ ආකාරයේ සතුට ගෙනදෙන සහ අභියෝගාත්මක ඉගෙනීමේ අවස්ථා තිබේද?
- ඇතුලත සහ පිටත ප්‍රදේශ දරුවන් හට උත්තේජනාත්මක ඉගෙනීමේ අත්දැකීම් ලබාදේද - උදාහරණ වශයෙන්, අළුත් දේ සොයා ගැනීමට සහ විමසා බැලීමට අවස්ථා ඇතිද? වෙනත් අය හෝ තනියම ක්‍රීඩා කිරීම සඳහා දරුවන් හට ඉඩකඩ තිබේද? දරුවන් හට නිහඬව සිටීමට ඉඩකඩ තිබේද?

## ඔබගේ ප්‍රශ්න සූදානම්ව තබා ගන්න

- ඔබගේ දරුවාගේ ඉගෙනීමට උපකාර කිරීමට ශික්ෂකයන් ඔබ සමඟ කෙසේ කටයුතු කරයිද?
- ඔබගේ දරුවා උනන්දුව ඇති දේ එක් කිරීමට ශික්ෂකයන් කෙසේ කටයුතු කරයිද?
- ඔබගේ දරුවාගේ ප්‍රගතිය සම්බන්ධයෙන් කථා කිරීමට කුමන අවස්ථා ඔබට තිබේද?
- ඔබගේ දරුවාට අමතර අවශ්‍යතා ඇතිනම්, සේවාව ඔබ සහ ඔබගේ දරුවාට කෙසේ උපකාර කරයිද?
- වැඩසටහන මගින් සක්‍රීය හැසිරීම උනන්දු කරන්නේ කෙසේද?
- ඔබගේ දරුවා අසනීපවුවහොත් හෝ නොසන්සුන් වුවහොත් කුමක් සිදුවේද?
- පහළ බාලාංශ සහතිකයක් සේවාව මගින් ප්‍රදර්ශනය කර ඇතිද? මෙම සහතිකය මගින් වික්ටෝරියානු රජය මගින් අරමුදල් ලබා දෙන බවටත් ඉගැන්වීම කරන්නේ බාල ළමා අවධිය සම්බන්ධයෙන් සුදුසුකම් ලත් ගුරුවරයෙකු බවටත් දක්වයි.
- ජාතික තත්ව සම්මතයන්ට අනුව, සේවාව සම්බන්ධයෙන් ඇති ඇගයුම (අධ්‍යාපනය සහ රැකවරණ සේවා සම්බන්ධ ඕස්ට්‍රේලියාව පුරා ඇති තත්ව ඇගයීම සම්බන්ධ ක්‍රමයක කොටසක්) කුමක්ද?
- ස්ථානයක් ලබා ගැනීම සඳහා බලාසිටීමේ ලැයිස්තුවක් ඇතිද? ඇතුලත් කිරීම හෝ බලා සිටීමේ ලේඛණයට ඇතුලත් කිරීම සඳහා මුදලක් තැන්පත් කල යුතුද? ඔබට තැන්පත් මුදල ගෙවීමට නොහැකි නම් සේවාව වෙත ඒ බව දන්වන්න.

## මාගේ දරුවා පහළ බාලාංශය ආරම්භ කරන විට වයස කීයක් විය යුතුද?

දරුවන් ප්‍රාථමික පාසල් යාම ආරම්භ කිරීමට කලින් වසරේ පහළ බාලාංශයට යාම සාමාන්‍යයෙන් සිදු කෙරේ. මෙය බොහෝවිට හඳුන්වන්නේ ‘වයස අවුරුදු හතරේ පහළ බාලාංශය’ වශයෙනි.

ඔබගේ දරුවා පාසල ආරම්භ කරන වසරේ අප්‍රියෙල් 30 වන දිනට වයස අවුරුදු පහ සම්පූර්ණ කර ඇතිනම්, පාසල් යාම ආරම්භ කල හැක. බැහැර කිරීමක් නොමැතිනම්, වයස අවුරුදු හය වන විට පාසල් යාම ආරම්භ කල යුතුය. ඔබගේ දරුවාගේ උපන් දිනය වැටෙන්නේ වසරේ අප්‍රියෙල් 30 දිනට පෙරනම්, ඔවුන් හට වයස පහ පිරෙන විට හෝ මීලඟ වසරේ දරුවාව පාසලට ඇතුලත් කිරීමට ඔබට තෝරාගත හැකිය. ළමුන් ඉගෙන ගන්නේ විවිධ අනුපාතවලින්, විවිධ ආකාරවලට සහ විවිධ අවස්ථාවලය. සමහර අවස්ථාවල, ඔබගේ දරුවා පහළ බාලාංශ වැඩසටහනක් පසු අවස්ථාවක ආරම්භ කිරීම මගින් ප්‍රතිලාභ අත්කරගත හැකිය.



## පහළ බාලාංශය ආරම්භ කිරීමට හොඳම වේලාව සම්බන්ධයෙන් උපදෙස් ලබාගත හැක්කේ කොහින්ද?

ඔබගේ දරුවා පහළ බාලාංශ වැඩසටහනක් ආරම්භ කලයුතු හොඳම වේලාව සම්බන්ධයෙන් ඔබට සැකයක් ඇතිනම්, පහළ බාලාංශ ශික්ෂකයෙකුගෙන් අසා දැනගන්න. ඔබගේ දරුවා හට පහළ බාලාංශ වැඩසටහන් මගින් උපකාර කල හැකි ආකාරය සොයා බලන්න.

ඔබගේ දරුවා යාමට බොහෝසේ ඉඩ ඇති පාසලේ විදුහල්පතිවරයා හෝ ගුරුවරයකු හමුවන්න. ප්‍රෙප් ආරම්භ කිරීමට හොඳම කාලය ඔවුන් සමඟ කථා කරන්න. ප්‍රෙප් වැඩසටහන මගින් ඔබගේ දරුවාට උපකාර කල හැකි ආකාරය සොයා බලන්න.

එසේම ඔබ හට ඔබගේ දරුවාගේ මාතෘ සහ ළමා සෞඛ්‍යය හෙදිය, පවුලේ වෛද්‍යවරයා සහ ඔබගේ දරුවාව දකින ඕනෑම වෘත්තීයකයෙකු සමඟ කථා කල හැකිය (උදාහරණ වශයෙන්, කථාව හා සම්බන්ධ චිකත්සක, භෞතචිකිත්සක හෝ ළමාරෝග සම්බන්ධ වෛද්‍යවරයා).

## මාගේ දරුවා හට වසරකට වඩා වැඩියෙන් පහළ බාලාංශ වෙත යා හැකිද?

පහත ළමුන් හට:

- ඇබොරිජිනල් සහ/හෝ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසීන්, හෝ
- ළමා ආරක්ෂණ විසින් දන්නා, හෝ ළමා ආරක්ෂණ විසින් Child FIRST වෙත යොමු කිරීම් කර ඇති

පාසලට යාමට වසර දෙකකට පෙර, එනම්, සාමාන්‍යයෙන් ඔවුන්ට වසර තුනේදී, පහළ බාලාංශ වෙත නොමිළේ හෝ අඩු වියදමකට යා හැකිය.

පිළියෙල කලේ:
Department of Education and Training
2, ට්‍රෙෂරි ප්ලේස්, ඊස්ට් මෙල්බර්න්
මෙල්බර්න් 3002
© වික්ටෝරියා ප්‍රාන්තය 2015 අගෝස්තු

වයස අවුරුදු තුනේ අය සඳහා නොමිළේ පහළ බාලාංශ සම්බන්ධ විස්තර සඳහා 4 වන පිටුව වෙත යන්න.

වයස අවුරුදු හතරේ පහළ බාලාංශ සම්පූර්ණ කරන සමහර වර්ධනය ප්‍රමාද දරුවන් හට පාසල් යාමට පෙර අරමුදල් ලබන පහළ බාලාංශ දෙවන වසරක් සම්පූර්ණ කිරීමෙන් ප්‍රතිලාභ ලබාගත හැකිය.

මෙම විකල්ප සම්බන්ධ වැඩිදුර තොරතුරු දැනගැනීමට කැමති නම්, පහළ බාලාංශ ශික්ෂකයෙකු සමඟ කථා කරන්න.

## ඔබට භාෂණ පරිවර්තකයෙකු අවශ්‍යද?

අරමුදල් ලබාදෙන පහළ බාලාංශ වැඩසටහන්වලට සහභාගිවන පවුල් සඳහා වික්ටෝරියානු රජය මගින් නොමිළේ භාෂණ පරිවර්තන සේවාවක් ලබාදේ.

## අදාල පුරුක්

නොමිළේ හෝ අඩු ගාස්තු පහළ බාලාංශ - **www.education.vic.gov.au/childhood/parents/kindergarten/Pages/fees.aspx**

වසර තුනක් වයස අය හට නොමිළේ පහළ බාලාංශ - **http://www.education.vic.gov.au/childhood/parents/kindergarten/Pages/earlystart.aspx**

වර්ධනයවීමේ ප්‍රමාද ඇති ළමුන් සඳහා පහළ බාලාංශ දෙවන වසර - **http://www.education.vic.gov.au/childhood/parents/kindergarten/Pages/secondyear.aspx**



VICTORIA State Government
Education and Training

# පහළ බාලාංශ සම්බන්ධ සියළු විස්තර

Sinhalese Translation



ළමුන් පහළ බාලාංශ වැඩසටහන් වෙත යන්නේ පාසල වෙත යාමට පෙර වසරේදී, එනම් ඔවුන් වයස අවුරුදු හතරේදීය. සමහර සේවා මගින් වයස අවුරුදු තුනේ අය සඳහාද පහළ බාලාංශ වැඩසටහන් ලබාදේ.

ඔබගේ දරුවාට පහළ බාලාංශය ආරම්භ කිරීමට හොඳම කාලය තෝරා ගැනීම සඳහා 6 වන පිටුව වෙත යන්න.

## පහළ බාලාංශය යනු කුමක්ද?

පහළ බාලාංශය (පෙර පාසල ලෙසද හැදින්වේ) යනු සුදුසුකම්ලත් පෙර ළමාවිය ගුරුවරයෙකු (early childhood teacher) විසින් කුඩා දරුවන් හට ලබාදෙන වැඩසටහනකි.

## මාගේ දරුවා පහළ බාලාංශයට යා යුත්තේ ඇයි?

පහළ බාලාංශය කුඩා දරුවන් සඳහා වැදගත් පියවරක් වන අතර සියළුම දරුවන් සඳහා ඉහළින් නිර්දේශ කෙරේ.

පර්යේෂණ මගන් පෙන්වන්නේ පහළ බාලාංශයට යාම මගින් දරුවන්ගේ සෞඛ්‍යය සහ සුබසිද්ධිය වැඩිදියුණු වන අතර ඔවුන් හට ශක්තිමත් සමාජ කුසලතාවයන් වර්ධනය කර ගැනීමටත් ඉගෙනීමට ආශාව ඇති කිරීමට උනන්දු කිරීමටත් උපකාර වන බවයි.

පහළ බාලාංශ වැඩසටහනකට සහභාගිවන දරුවන් වඩා ස්වාධීන සහ විශ්වාසයෙන් කටයුතු කරන අතර ප්‍රාථමික පාසල වෙත (ප්‍රෙප්) යාමට ඉතා හොඳින් සූදානම්වන බවයි.

## පහළ බාලාංශය තුළදී කුමක් සිදුවේද?

උසස් ගුණාත්මකබවකින් යුත් පහළ බාලාංශ වැඩසටහනක් මගින් උත්තේජනය කරන සහ සතුට ගෙනදෙන ඉගෙනීමේ අත්දැකීම් සහ ක්‍රියාකාරකම් රාශියක් ලබාදේ. ස්වාභාවික ලෝකය ගවේෂණය කිරීම සහ නව අදහස්වලට නිරාවරණයවීම සහ ගැටළු විසඳීම ආදී අත්දැකීම් සහ ක්‍රියාකාරකම් ඔස්සේ ඔබගේ දරුවාගේ ඉගෙනීම සහ කුතුහලය උනන්දු කෙරේ.

ඔබගේ දරුවාට පහත දේ කිරීමට හැකියාව ලැබේ:

- අනෙක් අය සමග කටයුතු කිරීමට ඉගෙනීම, කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් මිතුරන් ඇතිකර ගැනීම සහ සහයෝගයෙන් ක්‍රීඩා කිරීම
- සිය නිර්මාණශීලීතාවය ප්‍රකාශ කිරීම, උදාහරණ වශයෙන්, නැටුම්, චලනයන් සහ කලාව ඔස්සේ
- ශික්ෂකයන් සහ වෙනත් දරුවන් හට සවන්දීම සහ සංවාද ඇතිකර ගැනීම මගින් සිය සන්නිවේදන කුසලතා ගොඩනගා ගැනීම
- කියවීම, ලිවීම සහ ගණිතයට ඔවුනට අවශ්‍ය කුසලතාවයන් වර්ධනය කර ගැනීම





## පහළ බාලාංශයක් සොයාගත හැක්කේ කොහින්ද?

සමහර පහළ බාලාංශ තනියෙන් පාලනය කරන සේවා ආකාරයට ඇත (උදාහරණ වශයෙන්, ප්‍රජා පහළ බාලාංශ). අනෙක් පහළ බාලාංශ දිගු දිවා වැඩසටහන් හෝ පාසල් මගින් පාලනය කෙරේ.

ඔබගේ පළාතේ (නැතිනම් ඔබ කැමති පළාතක) ඇති පහළ බාලාංශයක් සොයාගැනීම සඳහා **www.education.vic.gov.au/findaservice/Home.aspx** or contact your local council, වෙබ්අඩවිය වෙත පිවිසෙන්න, නැතිනම් ඔබගේ පළාතේ කවුන්සිලය හා සම්බන්ධ වන්න. එම විස්තර **www.dtpli.vic.gov.au** වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ලබා ගත හැක.

ඔබගේ පවුලට සරිලන පහළ බාලාංශ වැඩසටහනක් තෝරා ගැනීම සම්බන්ධ උපදෙස් සඳහා 4 වන පිටුවට යන්න.

## සියළු දරුවන් හට පහළ බාලාංශයකට යා හැකිය.

පහළ බාලාංශ සියළුම දරුවන් සඳහාවේ. ඔබගේ දරුවාට ආබාධිතබවක් හෝ ඉගෙනීමේ දුෂ්කරතාවයක් ඇතිනම්, වැඩසටහන සහ පරිසරය මගින් ඔබගේ දරුවාට උපකාර කිරීමට හැකි ආකාරය සම්බන්ධයෙන් ශික්ෂකයන් විසින් ඔබට කථා කරනු ඇත.

ඔබගේ දරුවාව පහළ බාලාංශ වැඩසටහනකට ඇතුලත් කර ගැනීමට හෝ ඔබගේ පවුලට සරිලන වැඩසටහනක් සොයා ගැනීමට ඔබට උපකාර අවශ්‍යනම්, ඔබගේ පළාතේ කවුන්සිලය හා සම්බන්ධ වන්න.

## පහළ බාලාංශයකට කොතරම් මුදලක් වැයවේද?

වයස අවුරුදු හතරේ පහළ බාලාංශ සම්බන්ධ ගාස්තු හැකි තරම් අවම මට්ටමක තබා ගැනීම සඳහා අරමුදල් ලැබෙන පහළ බාලාංශ වැඩසටහනක් පවත්වා ගැනීමට අවශ්‍ය සේවාවලට දායකවීම සඳහා වික්ටෝරියානු රජය මගින් අරමුදල් ලබාදේ.

පහළ බාලාංශ වැඩසටහනකට වික්ටෝරියානු රජය මගින් අරමුදල් ලැබෙන අතර එම වැඩසටහන සපයන්නේ සුදුසුකම්ලත් පෙර ළමාවිය ගුරුවරයෙකු මගින් බව පෙන්වන මෙම සහතිකය දෙස බලන්න.


Kindergarten Program Certificate 2015

The kindergarten program at this early childhood education and care service is planned and delivered by a qualified early childhood teacher and receives funding from the Victorian Government.

VICTORIA State Government | Education and Training

පහළ බාලාංශ වැඩසටහන් ලබාදෙන සේවා මගින් බොහෝ අවස්ථාවල අදාල වැඩසටහන පවත්වා ගැනීමට යන වියදම් පියවා ගැනීම සඳහා ගාස්තු අයකෙරේ. ගාස්තු තීරණය කරනු ලබන්නේ එක් එක් සේවාවන් මගින් වන අතර ඔබගේ දරුවා සහභාගිවන පැය ගණන, කණ්ඩායමේ ප්‍රමාණය සහ විනෝද චාරිකා වැනි අමතර වියදම් මත ගාස්තු තීරණය කෙරේ.

## මාගේ දරුවාට සතියකට කොපමණ පැය ගණනක් පහළ බාලාංශ වෙත යා හැකිද?

බොහෝ වයස අවුරුදු හතරේ පහළ බාලාංශ වැඩසටහන් ලබාදෙන්නේ සතියකට පැය 15කි.

## පාසැල් යාමට පෙර වසරේ දරුවන් සඳහා නොමිළ හෝ අඩු වියදම් සහිත පහළ බාලාංශ

වික්ටෝරියානු රජය මගින් සමහර ළමුන්ගේ පහළ බාලාංශ ගාස්තු සඳහා සහනාධාර ලබාදෙන අතර මේ මගින් ඔවුන් හට ප්‍රාථමික පාසල ආරම්භ කිරීමට පෙර වසරේදී, සාමාන්‍යයෙන් ඔවුන්ට වයස අවුරුදු හතරේදී, නොමිළේ හෝ අඩු ගාස්තුවට පහළ බාලාංශයට ගිය හැක.







පහත අවස්ථාවල ඔබගේ දරුවා මේ සඳහා සුදුසුකම් ලබයි:

- ඔවුන් ඇබොරිජිනල් සහ/හෝ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසියෙකු නම්
- ඔවුන් තුන් නිවුන් හෝ සිව් නිවුන් නම්
- ඔවුන් (නැතිනම් ඔවුන්ගේ දෙමාපියෙකු හෝ භාරකරුවෙකු) හට සුදුසුකම් ලබන සහන කාඩ්පතක් ඇතිනම් හෝ සරණාගත, මානුෂික හිතවාදී හෝ සරණ පතන වීසා බලපත්‍රයක් දරයි නම්.

ඔබගේ දරුවා සහන ගාස්තු සඳහා සුදුසුකම් ලබන බව ඔබ සිතයිනම්, ඔබගේ දරුවාගේ පහළ බාලාංශ ශික්ෂක හෝ සේවා කළමණාකරුගෙන් විමසන්න.

## වසර තුනේ දරුවන් සඳහා නොමිළේ පහළ බාලාංශ

වික්ටෝරියානු රජය මගින් සමහර දරුවන් සඳහා සහන ගාස්තු ලබාදේ. මේ මගින් ඔවුන් ප්‍රාථමික පාසල ආරම්භ කිරීමට පෙර වසර දෙකක් සඳහා, සාමාන්‍යයෙන් ඔවුන්ගේ වයස අවුරුදු තුනේදී, නොමිළේ පහළ බාලාංශ පංති වෙත යා හැක.

ඔබගේ දරුවා අප්‍රියෙල් 30 වන දිනට අවම වශයෙන් වසර තුන සම්පූර්ණ කර ඇතිනම් සහ පහත අවශ්‍යතාවලින් එකක් සපුරාලයි නම් ඔබගේ දරුවා හට නොමිළේ පහළ බාලාංශ වෙත යාමට සුදුසුකම් ලබයි:

- ඇබොරිජිනල් සහ/හෝ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසියෙකු නම්, හෝ
- ළමා ආරක්ෂණ (Child Protection) විසින් දන්නේ නම්, හෝ ළමා ආරක්ෂණ වෙතින් වෙත Child FIRST යොමුකර ඇතිනම්.

ඔබගේ දරුවා පාසල් යාම ආරම්භ කිරීමට වසර දෙකකට පෙර නොමිළේ වැඩසටහනකට සහභාගිවුණි නම්, මීලග වසරේදී නොමිළේ හෝ අඩු වියදමට වසර හතරේ වැඩ සටහනට නොමිළේ හෝ අඩු වියදමට සහභාගි විය හැකිය.

වයස වසර තුනේ අය සඳහාවූ නොමිළේ පහළ බාලාංශ සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා ඔබගේ දරුවාගේ පහළ බාලාංශ ශික්ෂක හෝ සේවා කළමණාකරුගෙන් විමසන්න.

## පහළ බාලාංශ වැඩසටහනක් තෝරා ගැනීම

සෑම පවුලක්ම වෙනස්වේ. මෙයින් අදහස් වන්නේ ඔබ තෝරා ගනු ලබන පහළ බාලාංශ වැඩසටහන ඔබගේ දරුවාට සහ පවුලට සරිලන එකක් විය යුතුය.

ඇතුලත්කර ගැනීමේ පටිපාටි වික්ටෝරියාව පුරා වෙනස් වන නිසා, කල් ඇතිව පහළ බාලාංශ වැඩසටහනක් සොයා බැලීම හොඳ අදහසකි. සමහර සේවා මගින් ළමුන් වයස දෙක සම්පූර්ණ වූවිට අයදුම්පත් භාරගනී.

ඔබ පහළ බාලාංශ වැඩසටහන් කිහිපයක් තෝරාගත් පසු, ඔවුන් විවෘත දින හෝ තොරතුරු සැසිවාර පවත්වන්නේද යන්න සොයා බැලීමට හෝ හමුවීමක් පිළියෙ කර ගැනීමට සේවාව හා සම්බන්ධ වන්න.

ප්‍රශ්න ඇසීම සහ දරුවා සම්බන්ධ තොරතුරු හුවමාරු කර ගැනීම මගින් එක් එක් වැඩසටහනක් සම්බන්ධ ‘අදහසක්’ ලබා ගැනීමට මෙය කදිම ක්‍රමයකි. පහළ බාලාංශ වැඩසටහන පැවැත්වෙන දින සහ වේලාවන්, ඔබගේ දරුවාව ඇතුලත් කල හැකි ආකාරය, අයකරන ගාස්තු සහ සහනාධාර අදාලවේද යන්න සොයා බැලිය හැකිය.

ඔබට හැකිනම් එක් වැඩසටහනකට වැඩි ප්‍රමාණයකට ගොස් බලන්න. වෙනත් පවුල්වල අය කියන දේ මත විශ්වාසය නොතබන්න.